www.kidworship.kr

# මෝසෙස් 3

– 16th Story–


109Page

**පොතේ ගුරා** මෝසෙස් සහ ඉශ්රායෙල් සෙනඟ කානාන් දේශය කරා යන දිගු ගමන ආරම්භ කළා. දෙවියන්වහන්සේ ඔවුන්ව කාන්තාරය මැදින් රතු මුහුදු දිශාවට රැගෙන යනවා. දවල් කාලයේ දී ඔවුන්ව අව් රශ්මියෙන් ආරක්ෂා කරන පිණිස වළාකුලක් ඔවුන්ට ඉහළින් තැබුවා. රාත්‍රී කාලයේ දී ඔවුන්ට මගපෙන්වන පිණිස ඔවුන්ට ඉහළින් ගිනි ටැඹක් ගමන් කළා.

**ජනතාව** අපට මගපෙන්වන දෙවියන්වහන්සේට ප්‍රශංසා වේවා !

**පොතේ ගුරා** අන්තිමේ දී සෙනඟ රතු මුහුද ඉදිරියට ඇවිත් සිටගත්තා.
ජනතාව ඔවුන්ගේ කූඩාරම් ගසා මඳක් විවේක ගන්නා ලෙස මෝසෙස් ඔවුන්ට කිව්වා. ඒ නිසා සෙනඟ විවේකය ගත් අතර තමන්ගේ සත්වයන් ද බලාගත්තා.

..........................................................................................


110Page

**පොතේ ගුරා** මේ අතරතුරේ ඉශ්රායෙල් සෙනඟ නිදහස් කිරීම ගැන ඵාරාවො නොසතුටුභාවයට පත්ව සිටියා.

**ඵාරාවෝ** මම මෝඩයෙක්. මම මෝඩ වුණා. ඉශ්රායෙල් සෙනඟ යන්ට හැරියාම කවුද මේ රටේ වැඩ කරන්නේ ? ඔවුන් නැවත ගෙන්වා ගැනීම අපට අවශ්‍යයි. දැන්මම ඉශ්රායෙල් පස්සෙන් ගිහින් ඔවුන් ඉක්මනින් නැවතත් වහල්ලු විදිහට අරගෙන එන්න !!!

**පොතේ ගුරා** ඵාරාවොගේ අශ්වයන් ද රථ ද අශ්ව රෝහකයන් ද කාන්තාරයේ ඉශ්රා-යෙල් සෙනඟ පිටුපස ලුහු බඳින්න පටන් ගත්තා.

..........................................................................................


111Page

**පොතේ ගුරා** රතු මුහුද ළඟ විවේක ගනිමින් සිටි ඉශ්රායෙල් සෙනඟ ඊජිප්තුවරුන් නැවත ඔවුන් පසුපස ලුහුබඳවා එනු ආකාරය දකිනවා.
ඔවුන් හොඳටම බය වෙනවා.

**කාන්තාවක්** මේ කාන්තාරයේ මැරෙන පිණිස ඔබ අපව ගෙන ආවේ ඇයි ?

**මිනිසෙක්** අපි ඊජිප්තුවරුන්ට සේවය කරන එක හොඳයි, මේ කාන්තාරයේ අපි මැ-රෙනවාට වඩා.

**පොතේ ගුරා** ඉශ්රායෙල්වරුන් ඊජිප්තු හමුදාව දුටු ගමන් හොඳටම බය වෙලා මෝසෙස්ට දොස් කියන්න පටන් ගත්තා. මේ වෙලාවේ මෝසෙස් සෙනඟට කතා කළා.

**මෝසෙස්** බය වෙන්න එපා. දෙවියන්වහන්සේ අපිව ගලවා ගනියි.

**පොතේ ගුරා** නමුත්, ඊජිප්තු හමුදාව වේගයෙන් ඔවුන් කරා ළඟා වුණා.

..........................................................................................


112Page

**පොතේ ගුරා** දෙවියන්වහන්සේ මෝසෙස්ට කතා කළ සේක.

**දෙවියන්වහන්සේ** මෝසෙස්, මගේ සෙනඟ රතු මුහුදෙන් එගොඩ කරන්න.
ඔබේ සැරයැටිය අතට ගෙන රතු මුහුද දෙසට දිගු කරන්න.
එවිට රතු මුහුද දෙනට බෙදී වියළි බිමක් මෙන් වෙනවා ඇත.
එවිට සෙනඟට වියළි භූමිය මැදින් එගොඩ වන්නට පුලුවන්.



113Page

පොතේ ගුරා මෝසෙස්, ඔහුට දෙවියන්වහන්සේ කී ලෙසම කළා.
ඔහු සැරයැටිය අතින් ගෙන මුහුද දෙසට අත දිගු කළා.
එවිට මහත් සුළඟක් පැමිණ ජලය දෙකට බෙදා මුහුද ගොඩබිමක් බවට පත් වුණා. ජලය ද බෙදී ගියා. ජලය දෙපසින් පිහිටා තාප්පයක් මෙන් වුණා.

ජනතාව බලන්න, ජලය දෙකට බෙදුණා !

පොතේ ගුරා ජනතාවගේ සතුට වැඩිවෙලා මිනිස්සු මුහුද මැදින් ඇවිදගෙන යන්න පටන් ගත්තා. ඉශ්රායෙල් සෙනග ඉතාම ආරක්ෂාකාරීව මුහුද මැදින් ඇවිදගෙන ගියා.

....................................................................................

පොතේ ගුරා ඊජිප්තු හමුදාවත් වේගයෙන් මුහුද ළඟට ආවා.

දෙවියන්වහන්සේ ඔබේ අත මුහුද දෙසට දිගු කරන්න.

පොතේ ගුරා මෝසෙස් දෙවියන්වහන්සේ කී ආකාරයටම, මුහුද දෙසට සැරයැටිය දිගු කළා. එවිට ක්ෂණිකයකින්ම ජලය නැවත එකට එකතු වුණා.
ඊජිප්තු හමුදාව වතුර මැදින් පැනලා යන්න පටන් ගත්තත් ජලය ඔවුන්ව යට කරලා දැම්මා. ඔවුන් පමණක් නොව ඔවුන්ගේ අශ්වයන් ද රථ ද ජලයට යට වී විනාශ වුණා.

ජනතාව පුදුමයි... හරි පුදුමයි...
දෙවියන්වහන්සේ නම් මහා බලවත්. සර්ව බලධාරියි.

පොතේ ගුරා සියලු ඉශ්රායෙල්වරු දෙවියන්වහන්සේට ප්‍රශංසා කළා.
ඔවුන් දෙවියන්වහන්සේවත් උන්වහන්සේගේ දාසයා මෝසෙස්වත් විශ්වාස කළා. මේ ආකාරයෙන් දෙවියන්වහන්සේ ඉශ්රායෙල්වරුන්, පොරොන්දු වූ කානාන් දේශයට රැගෙන යන්නට මෝසෙස් කැඳවා තිබුණා.

....................................................................................

ජීවිතයට අදාල කිරීම දුවේ පුතේ, දෙවියන්වහන්සේ මිනිසුන්ට ගොඩක් ආදරෙයි.
උන්වහන්සේ සියලු මිනිසුන් දුක් විඳීමෙන් ගළවාගන්න සේක.
ඔයා දන්න දුක්විඳින මිනිසුන් ගැන දෙවියන්වහන්සේට යාච්ඤා කරන්න.